# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2363/65 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ 2 වන උප වගන්තිය යටතේ වූ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ 1 වන උප වගන්තිය සමඟ කියවිය යුතු 2 වන උප වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂයභාර අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින් වරාය, නාවික හා ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයාගේ උපදේශකත්වය ඇතිව මෙම නිවේදනය මඟින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත්කරමි:-

1. කොළඹ වරාය දකුණු ආසියානු කලාපය සඳහා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ ඉලක්කය සහිතව, ශ්‍රී ලංකාවේ සැපයුම් සේවා කාර්යසාධනය දියුණු කිරීම සහ ගුදම් තුළට හා ගුදම්වලින් නැව් භාණ්ඩ කාර්යක්ෂමව හා ඵලදායිව නිෂ්කාශනය කිරීමේ හැකියාව ඇති කිරීම, උසස් තත්වයේ බැඳුම්කර ගබඩා පහසුකම් සැලසීම, විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහාලුම් (MCC) හෝ බහාලුමකට ප්‍රමාණවත් නොවූ නැව්බඩු (LCL) මඟින් අපනයන හා ආනයන නැව් බඩුවලට අගය එකතු කිරීම් සඳහා ගුදම් පහසුකම් සැලසීම, උෂ්ණත්ව පාලනය කරන ලද ගුදම් පහසුකම් / ගබඩා පහසුකම් සැලසීම යන ආර්ථික සහ සමාජීය ප්‍රතිලාභ රටට ලබාදීමේ හැකියාව සහිත ජාතික යහපත සඳහා වූ කොළඹ වරායේ සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය (මින්මතු මෙම නිවේදනයේ ''ව්‍යාපෘතිය'' යනුවෙන් සඳහන් කරනු ලබන)ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගන්නා ලදී.

2. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය (මින්මතු ''වරාය අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් ලෙස විශේෂ කාර්ය අංශයක් (මින්මතු මෙම නිවේදනයේ ''SPV" යනුවෙන් සඳහන් කරනු ලබන) යටතේ වසර පනහ (50) ක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉදිකිරීම, අරමුදල් යෙදවීම, සංවර්ධනය කිරීම, මෙහෙයුම් කිරීම, කළමනාකරණය, නඩත්තුව සහ කොළඹ වරාය සේවා සැපයුම් මධ්‍යස්ථානය පවරාදීම මෙයට අයත් වන බව ප්‍රකාශ කර ඇත. උක්ත විශේෂ කාර්යය අංශයේ (SPV) කොටස් හිමිකම පහත පරිදි වෙයි.

(අ) සීමාසහිත චයිනා මර්චන්ට්ස් පෝර්ට් හෝල්ඩින්ග්ස් සමාගම (China Merchants Port Holdings Company Limited (CM Port)- 70%

(ආ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය - 15 %

(ඇ) දේශීය සමාගමක් වන ඇක්සස් ඉන්ජිනියරින් පී එල් සී (Access Engineering PLC) - 15 %



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මෙම ව්‍යාපෘතිය සවුත් ඒෂියා කොමර්ෂල් ඇන්ඩ් ලොජිස්ටික්ස් (එස් ඒ සී එල්) හබ් (South Asia Commercial and Logistics (SACL) Hub) වන අතර, ව්‍යාපෘති සමාගම සවුත් ඒෂියා කොමර්ෂල් ඇන්ඩ් ලොජිස්ටික්ස් හබ් ලිමිටඩ් (South Asia Commercial and Logistics Hub Limited) නම් වන බව ප්‍රකාශකර ඇත.

4. සම්පූර්ණ ව්‍යාපෘතිය අදියර 2ක් යටතේ පහත සඳහන් පරිදි සැලසුම් කර ඇති බව ප්‍රකාශ කර ඇත.

(අ) පළමු අදියර මහල් 1-5 දක්වා වන ගබඩාවක් සහ කාර්යාල ප්‍රදේශයක් සඳහා වන ගොඩනැගිල්ලකි. ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා වන එක්සත් ජනපද ඩොලර් මිලියන දෙසිය අසූව (USD 280,000,000) ක ව්‍යාපෘති පිරිවැය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මින්මතු "ආයෝජන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමඟ ගිවිසුම් ගතවන දින සිට මාස හතළිස් දෙක (42)ක කාල සීමාවක් තුළදී යොදවනු ලබයි.

(ආ) දෙවන අදියර මහල් 6-8 දක්වා වන බෙදාහැරීමේ සහ වෙළඳ මධ්‍යස්ථානයයි. ව්‍යාපෘති සමාගම සහ වරාය අධිකාරිය සමඟ 2023 අප්‍රේල් 21 වන දින ඇතිකරගත් ඉදිකර, මෙහෙයුම් කර, පවරාදීමේ ගිවිසුම (Built Operate and Transfer - BOT) අනුව ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘතියේ දෙවන අදියර කරගෙන යනු ඇත.

5. තවද, ව්‍යාපෘතියේ පළමු අදියරේ අපේක්ෂිත ආයෝජනය වන එක්සත් ජනපද ඩොලර් මිලියන දෙසිය අසූව (USD 280,000,000) ක මුදල 70:30 වන ණය හිමිකම් අනුපාතිකය මත මූල්‍යනය කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි.

6. ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා, සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව මෙම නිවේදනයෙහි උපලේඛනයේ සඳහන් කර ඇති බදු නිදහස් කිරීම, අමාත්‍ය මණ්ඩලය සහ ආයෝජන මණ්ඩලය අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘති සමාගම සඳහා අදාළ විය යුතු බවට නිශ්චිතව දක්වමි.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 19 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

කොළඹ වරායේ සේවා සැපයුම් මධස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදීමට නියමිත බදු නිදහස් කිරීම්

1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

(i) සංස්ථාපිත ආදායම් බද්ද

උක්ත ව්‍යාපෘතියේ අනුමත ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වන ලාභ සහ ඉපයීම් මත ව්‍යාපෘති සමාගම සඳහා ආදායම් බදු පැනවීමට අදාළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ("බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව") අවුරුදු පහළොව (15)ක කාලසීමාවක් සඳහා අදාළ නොවිය යුතුය.

එකී බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව, ව්‍යාපෘති සමාගම විසින් බදු අයකළ හැකි ලාභ ඉපයීම සිදුකරනු ලබන පළමු වර්ෂයේ සිට හෝ ව්‍යාපෘති සමාගම විසින් ස්වකීය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් පසුව එළඹෙන අවුරුදු දෙක (02)ක කාලසීමාවක සිට යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවේ සිට ආරම්භ විය යුතුය.

(ii) ලාභාංශ මත බද්ද

බදු නිදහස් ලාභ සහ ඉපැයීම් තුළින් කොටස් හිමියන් වෙත බෙදා හරිනු ලබන සහ ඔවුන් විසින් ලබාගන්නා ලාභාංශ, ඉහත කී අවුරුදු පහළොව (15)ක බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව තුළ දී සහ ඉන්පසුව අවුරුද්ද (01)ක කාලසීමාවක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

(iii) රඳවා ගැනීමේ බද්ද

සම්පූර්ණ ව්‍යාපෘති කාල සීමාව පුරා ව්‍යාපෘති සමාගම රැඳවුම් බද්දෙන් නිදහස් කළ යුතුය.

(iv) පුද්ගල ආදායම් බද්ද

ඉහත කී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සේවා නියුක්තියෙන් ලැබෙන ඉපයීම් සහ ලාභය මත අවුරුදු පහළොව (15) ක බදු ගෙවීමෙන් නිදහස් කාල සීමාව තුළදී අවුරුදු පහ (05)ක කාලසීමාවක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් තිස් (30) දෙනෙකුට යටත්ව ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවා නියුක්තිකයන් නිදහස් වන්නේ ය.

2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (VAT බදු පනත)

ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන, ව්‍යාපෘතිය හා බැඳුණු සියලුම ආනයන භාණ්ඩ, ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්ගත වන දින සිට ආරම්භව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය වන මාස හතලිස් දෙක(42)ක කාල සීමාව තුළදී එකතු කළ අගය මත බදු (VAT බදු) ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

3. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත

ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන, ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන භාණ්ඩ, ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වන දින සිට ආරම්භව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය වන මාස හතලිස් දෙක (42)ක කාල සීමාව තුළදී වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු (PAL) ගෙවීමෙන් සහ අයකිරීමෙන් නිදහස් වන්නේය.

4. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන, ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන භාණ්ඩ, ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වන දින සිට ආරම්භව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය වන මාස හතලිස් දෙක (42) ක කාල සීමාව තුළදී සෙස් බද්ද (CESS) ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

5. රේගු ආඥාපනත (235 වන අධිකාරය)

ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන, ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන භාණ්ඩ (මුදල් අමාත්‍යාංශය මඟින් ප්‍රකාශයට පත් කළ අසාධු ලේඛනයේ දැක්වෙන අයිතම හැර) ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගතවන දින සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාලය වන මාස හතලිස් දෙක(42)ක කාලසීමාව තුළදී රේගු ආනයන බද්දෙන් (CID) නිදහස් වන්නේය.

එසේ වුවද අසාධු ලේඛනයේ සඳහන් අයිතම ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරනු නොලබයි නම් හෝ නිමවනු නොලබයි නම් එම අයිතම ප්‍රමාණවත් තත්වයෙන්, ප්‍රමාණවලින් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ලබා දී ඇති කාල සීමාව තුළදී සපයා ගැනීමට නොමැති අවස්ථාවකදී එම අසාධු ලේඛනයේ සඳහන් අයිතම ආනයනය කිරීම පිළිබඳව ආයෝජන මණ්ඩලය විසින් සලකා බලනු ඇත.

EOG 12 - 0324

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.